# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல்
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO
1075

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
29/06/2024
පැය 1605

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - පමුණුගම පොලිස් වසම.

2024.06.29 වන දින උදෑසන කාලයේදී පමුණුගම පොලිස් වසමේ ජා-ඇල පමුණුගම මාර්ගයේ දැලතුර ප්‍රදේශයේදී ජා ඇල සිට බෝපිටිය දෙසට ගමන් කරමින් තිබූ ලොරි රථයක් එම මාර්ගයේ ගමන් කරමින් තිබූ යතුරුපැදියක ගැටී ඒ අසල තිබූ වෙළඳසැලක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදියේ පැදිකරු එම ස්ථානයේදීම මිය ගොස් ඇති අතර වෙළඳසැලක තුල සිටි කාන්තාවක් ද තුවාල ලබා ප්‍රතිකාර සඳහා රාගම රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වන උස්වැටකෙයියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.06.28 වන දින රාත්‍රී කාලයේදී බොරැල්ල පොලිස් වසමේ කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 730 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන කොළඹ 08 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. නීති විරෝධී මත් පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය .

2024.06.29 වන දින රාත්‍රී කාලයේදී පමුණුගම පොලිස් වසමේ උස්වැටකෙයියාව ප්‍රදේශයේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 67 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන උස්වැටකෙයියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**